සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
අවසාන වාර පරීක්ෂණය 2022

11 ශ්‍රේණිය **කෘෂි හා ආහාර තාක්ෂණය - I/II** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකයඃ

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. මින්නේරි දෙවියන් ලෙස පුද ලද රජුගේ නම කුමක් ද?

(1) මහසෙන් රජු (2) ධාතුසේන රජු (3) පරාක්‍රමබාහු රජු (4) වසභ රජු

02. යුරෝපීය ආක්‍රමණ නිසා මෙරට යැපුම් කෘෂිකර්මය වාණිජ කෘෂිකර්මය බවට පත්විය. මෙසේ වානිජකරණය නිසා ප්‍රධාන වගා බවට පත් වූයේ,

(1) පොල්, තේ, රබර්, කෝපිය. (2) වී, කුරුඳු, මිරිස් හා පොල්ය.
(3) පොල්, පුවක්, කිතුල් හා කුරුඳුය. (4) තේ, පොල්, පුවක් හා වී ය.

03. වැවක වැඩිපුර ඇති ජලය ඉවත් කිරීමට ඇති ප්‍රධාන කොටස කුමක් ද?

(1) වැව් බැම්ම (2) වාරිමාර්ග ඇල (3) පිටවාන (4) බිසෝකොටුව

04. වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාවය බෝග වගාවට බලපාන එක් කාලගුණික පරාමිතියකි. වැඩි සාපේක්ෂ ආර්ද්‍රතාවය යටතේ දී,

(1) ශාක රෝග ආසාදන වැඩි වේ. (2) දඬු කැබලි මුල් ඇදීම දුර්වල වේ.
(3) ගබඩා බීජ වැඩි කලක් තබාගත හැකි වේ. (4) කෘමි පලිබෝධ හානි අඩු වේ.

05. කාලගුණික පරාමිති පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- සාපේක්ෂ ආර්ද්‍රතාවය ප්‍රතිශතයක් ලෙස දක්වනු ලැබේ.

B- සුළගේ වේගය පැයට කිලෝමීටර් වලින් මනිනු ලැබේ.

C- ආලෝක තීව්‍රතාව ලක්ස් වලින් මනිනු ලැබේ.

මෙයින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි.
(3) B සහ C පමණි. (4) A, B හා C සියල්ලම ය.

06. ආලෝක තිව්‍රතාවය මැනීමට යොදාගන්නා ඒකකය වන්නේ,

(1) සෙල්සියස් (2) ලක්ස් (3) පැයට කිලෝමීටර් (4) මිලි මීටර්

07. පාංශු පැතිකඩක් සලකා බැලීමේ දී පොලොව මතුපිටින්ම පිහිටන කලාපය වන්නේ,

(1) R කලාපය (2) C කලාපය (3) A කලාපය (4) B කලාපය

මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

08. පාංශු සංඝටක සැලකීමේ දී වැඩිම ප්‍රතිශතයක් ඇත්තේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

(1) පාංශු ජලය (2) පාංශු වාතය (3) පාංශු ඛනිජ (4) පාංශු කාබනික ද්‍රව්‍ය

09. පාංශු වර්ණය කෙරෙහි බලනොපාන සාධකයක් වන්නේ,

(1) පසේ සිටින ජීවීන්ගේ ඝනත්වය (2) පසේ අඩංගු ඛනිජ වර්ගය

(3) පසේ අඩංගු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය (4) පසේ ජලවහනය තත්වය

10. පහත සඳහන් ශාක අතරින් රනිල කුලයේ ශාකයක් නොවන්නේ,

(1) මෑ (2) කංකුන් (3) උඳු (4) කඩල

11. බෝග වගාවේ දී සකසනු ලබන පාත්ති වර්ග අතරින් පොල් වගාව සඳහා සුදුසු පාත්ති වර්ගය මින් කුමක් ද?

(1) උස් වූ පාත්ති (2) ගිල් වූ පාත්ති (3) තනි වගා වලවල් (4) වැටි සහ කානු

12. බීජ සහ රෝපණ ද්‍රව්‍ය වගා බිමෙහි ස්ථාපිත කිරීම මින් කුමක් ලෙස හඳුන්වනු ලැබේ ද?

(1) බෝග සංස්ථාපනය. (2) බෝග වර්ගීකරණය. (3) බීජ ප්‍රරෝහණය. (4) බීජ සුප්තතාවය.

13. පහත සාධක අතරින් තවාන් ජීවාණුහරණය සඳහා යොදා නොගන්නා ක්‍රමයක් වන්නේ කුමක් ද?

(1) සූර්ය තාපය මගින් (2) පිලිස්සීම මගින්

(3) උණු ජලය මගින් (4) පසට අලුහුණු එකතු කිරීම මගින්

14. උස් වූ පාත්තියක් සැකසීමේ දී පාත්තියක උස දළ වශයෙන් කොපමණ විය යුතු ද?

(1) 10 cm (2) 15 cm (3) 25 cm (4) 50 cm

15. බෝග වගාවේ ප්‍රධාන ජල කලමණාකරණ උපාය මාර්ගයක් නොවන්නේ මින් අතරින් කුමක් ද?

(1) ජල වහනය (2) ජල අවශෝෂණය

(3) පාංශු ජල සංරක්ෂණය (4) ජල සම්පාදනය

16. පහත සඳහන් සාධක අතරින් පසෙන් ජලය ඉවත්වන ක්‍රමයක් නොවන්නේ මින් කුමක් ද?

(1) වර්ෂාපතනය (2) උත්ස්වේදනය (3) වාෂ්පීකරණය (4) ගැඹුරු වැස්සීම

17. පහත සඳහන් වල්පැලෑටි අතරින් ආක්‍රමණශීලී වල්පැලෑටියක් වන්නේ මින් කුමක් ද?

(1) මොනර කුඩුම්බිය (2) ගොඩ මාරුක් (3) තුනැස්ස (4) යෝධ නිදිකුම්බා

18. කෙසෙල් වඳ පිදීම කුමන රෝගකාරකයක් නිසා ඇතිවන්නක් ද?

(1) බැක්ටීරියා රෝග කාරක (2) වෛරස් රෝග කාරක

(3) වටපණු රෝග කාරක (4) ෆයිටොප්ලාස්මා රෝග කාරක

19. පහත සඳහන් වී ප්‍රභේද අතරින් පාරම්පරික වී ප්‍රභේදයක් නොවන්නේ මින් කුමක් ද?

(1) H4 (2) සුවඳැල් (3) කළුහීනටි (4) කුරුළු තුඩු වී

20. ගොයම් පැලෑටියේ මේරීමේ අවධිය දින කීය ද?

(1) දින 45 (2) දින 60 (3) දින 75 (4) දින 30

21. බීජාවරණයෙහි වර්ධක නිශේධක අඩංගු වීම නිසා ප්‍රරෝහණය ප්‍රමාද වන බීජ වර්ගයක් වනුයේ,

(1) අඹ (2) සියඹලා (3) පැපොල් (4) බඩඉරිඟු

22. පහත සඳහන් සාධක අතරින් බීජ ප්‍රරෝහණය සඳහා අත්‍යාවශ්‍ය සාධක වනුයේ,

(1) කාබන්ඩයොක්සයිඩ් හා ඔක්සිජන් ය. (2) කාබන්ඩයොක්සයිඩ් සහ ජලය ය.

(3) ඔක්සිජන් හා ජලය ය. (4) ජලය හා සූර්යාලෝකය ය.

23. මුල් කැබලි මඟින් ප්‍රචාරණය කළ හැකි බෝග වනුයේ,

(1) බතල හා මඤ්ඤොක්කා ය. (2) මුකුණුවැන්න හා කංකුං ය.

(3) අක්කපාන හා බිගෝනිය ය. (4) කරපිංචා හා දෙල් ය.

24. බිගෝනියා, පෙපරෝමියා හා සැන්සවේරියා ආදී විසිතුරු පත්‍රික ශාක ප්‍රචාරණය සඳහා වඩාත්ම සුදුසු ක්‍රමය මින් කුමක් ද?

(1) දඬු කැබලි සිටුවීම. (2) මුල් කැබලි සිටුවීම.

(3) පත්‍ර කැබලි සිටුවීම. (4) අතු බැඳීම.

25. පහත සඳහන් ද්‍රව්‍ය අතරින් නිර්පාංශු වගාවේ පෝෂණ මාධ්‍ය ලෙස භාවිත කිරීමට වඩාත් සුදුසු වනුයේ,

(1) ඇල්බට් ද්‍රාවණයයි. (2) ඒගාර් මාධ්‍යයයි.

(3) ගැඩවිලි පොහොර මිශ්‍රණයයි. (4) බෙරඩෝ මිශ්‍රණයයි.

26. වායුගෝලීය තත්ව සමඟ සංසන්දනය කිරීමේ දී සරල සූර්ය ප්‍රචාරකයක් තුළ

(1) උෂ්ණත්වය සහ ආලෝකය අඩුය.

(2) සාපේක්ෂ ආර්ද්‍රතාවය හා උෂ්ණත්වය වැඩි ය.

(3) සාපේක්ෂ ආර්ද්‍රතාවය අඩු අතර උෂ්ණත්වය වැඩි ය.

(4) සාපේක්ෂ ආර්ද්‍රතාවය වැඩි අතර උෂ්ණත්වය අඩු ය.

27. ගොවිපලක එක් නිෂ්පාදනයක අතුරු ඵල තවත් නිෂ්පාදන ඒකකයක අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින් එකම භූමියක් තුළ බෝග වගාව සත්ත්ව පාලනය හා බලශක්ති නිෂ්පාදනය ආදී ක්‍රියාවලි ඒකාබද්ධව සිදු කරනු ලබන්නේ,

(1) හේන් ගොවිතැනේ ය. (2) සංරක්ෂණ ගොවිතැනේ ය.

(3) කාබනික ගොවිතැනේ ය. (4) සමෝධානිත ගොවිතැනේ ය.

28. පසු අස්වනු තාක්ෂණයේ ප්‍රධාන අරමුණ නම්,

(1) අස්වනු නෙළීම සඳහා යන්ත්‍රෝපකරණ භාවිත කිරීමය.

(2) පසු අස්වනු සාධක කළමණාකරණය මගින් අස්වනු හානිය අවම කිරීම ය.

(3) අස්වනු ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් පෙට්ටි භාවිත කිරීමය.

(4) අස්වනු ගබඩා කිරීමට ශීතකාමර භාවිත කිරීම ය.

29. තක්කාලි, පැෂන් හා පැපොල් ඵල ඉදෙන විට ඒවායේ බීජ වටා සෙවලමය ද්‍රව්‍ය පටලයක් දක්නට ලැබේ. මෙම පටලය මඟින් සිදු කරනුයේ, එම බීජ

(1) ඵලය තුළදීම ප්‍රරෝහනය වීම වැළැක්වීමයි. (2) කෘමි උවදුරු වලින් ආරක්ෂා කිරීම යි.

(3) ඵලය තුළ ඇලී තිබීමට උපකාරී වීම යි. (4) පක්ෂීන්ගේ හොටේ ඇලී තිබීමට උපකාරී වීමයි.

30. පාසල් සෞඛ්‍ය වෛද්‍ය පරීක්ෂණයක දී සමහර සිසුන්ගේ ඇස් පෙනීම දුර්වල බවත්, රාත්‍රී අන්ධතාවයෙන් පෙළෙන බවත්, හම ගොරෝසු බවත් අනාවරණය විය. මෙම තත්වයට පිළියමක් වශයෙන් වැඩියෙන් ආහාරයට ගත යුතු වන්නේ,

(1) කව්පි, කඩල, මුං, පරිප්පු, සෝයා බෝංචි

(2) ගොටුකොළ, මුකුණුවැන්න, කැරට්, සාරණ, බිත්තර

(3) බත්, මාළු, කිරි, බිත්තර, වැටකොලු

(4) බතල, අර්තාපල්, බීට්, රාබු, නෝකෝල්

31. ඉතා ඉක්මනින් නරක්වන සුළු ආහාර අධි අවධානම් ආහාර ලෙස හඳුන්වයි. පහත ආහාර කාණ්ඩ අතරින් අධි අවධානම් ආහාර වර්ග අඩංගු පිළිතුර වනුයේ,

(1) මාළු, කිරි, හා මස් ය. (2) මාළු, කිරි හා පැපොල් ය.

(3) බිත්තර, මස් හා වියළි මිදි ය. (4) බත්, කේක් හා මස් ය .

32. වියළීම සඳහා එළවළු කැබලි කැපූ විගස ඒවා බ්ලාන්චිකරණය කරනු ලැබේ. මෙයින් අපේක්ෂා කරනුයේ,

(1) ක්‍ෂුද්‍ර ජීවීන් විනාශ කිරීමයි. (2) වියළීම පහසු කිරීමයි.

(3) තෙතමනය ඉවත් කිරීම යි. (4) එන්සයිම අක්‍රීය කිරීමයි.

33. ජෑම් නිෂ්පාදනයේ දී යොදා ගනු ලබන ප්‍රධාන ආහාර පරිරක්ෂණ ක්‍රමය වන්නේ,

(1) සාන්ද්‍රීකරණයයි. (2) අවම සැකසීමයි.

(3) උෂ්ණත්ව පාලනයයි. (4) පැසවීමයි.

34. ශ්‍රී ලංකාවේ පහත රට වියළි කලාපයේ ඇති කිරීමට යෝග්‍ය ගව වර්ගයක් වන සහීවාල්,

(1) දේශීය ගව වර්ගයකි. (2) ඉන්දීය ගව වර්ගයකි.

(3) යුරෝපීය ගව වර්ගයකි. (4) ඇමෙරිකානු ගව වර්ගයකි.

35. ගව දෙනකගේ සම්මත වියළි කාලය

(1) මාස 02 කි. (2) මාස 04 කි. (3) මාස 08 කි. (4) මාස 09 කි.

36. කුකුළු පැටවුන් බෲඩරයක් තුළ රැකබලා ගැනීමේ ප්‍රධාන අරමුණ වනුයේ,

(1) රෝග වැළඳීම වළක්වා ගැනීම ය.

(2) විලෝපිකයින්ගෙන් පැටවුන් ආරක්ෂා කර ගැනීම ය.

(3) පරිසර උෂ්ණත්වයට හුරුවන තෙක් පැටවුන් රැකබලා ගැනීමය.

(4) නුසුදුසු පැටවුන් ඉවත් කිරීම පහසු කර ගැනීම ය.

37. කුකුළන්ට වැළදෙන කොක්සිඩියෝසිස් රෝගයේ රෝගකාරකයා,

(1) බැක්ටීරියාවකි. (2) ප්‍රොටෝසෝවාවෙකි. (3) වට පණුවෙකි. (4) වෛරසයකි.

38. නිදිබරව එකට ගුලි වී සිටින කුකුළු පැටවුන්ගේ ගුද මාර්ගය අවට සුදු පැහැති මළ ද්‍රව්‍ය බදාමයක් සේ ඇලී තිබෙනු දක්නට ලැබිණි. මොවුන්ට වැළඳී ඇති රෝගය විය හැක්කේ,

(1) කොක්සිඩියෝසිස් ය. (2) පුල්ලෝරම් ය.

(3) රැනිකට් ය. (4) වටපණු ආසාදනය ය.

39. වීදුරු මතුපිටක කිරි සාම්පලයෙන් බිංදුවක් දැමූ විට සුදු පැහැති සීමා සලකුණක් නොපෙන්වා එය ගලා ගියේ ය. මෙයින් නිගමනය කළ හැක්කේ, කිරිවලට

(1) ක්ෂුද්‍ර ජීවී ආසාධනය වී ඇති බවයි. (2) ජලය මිශ්‍ර වී ඇති බවයි.

(3) වර්ණක මිශ්‍ර වී ඇති බවයි. (4) පොල්තෙල් මිශ්‍රවී ඇති බවයි.

40. ආහාර ඇතුලු භාණ්ඩ හා සේවාවල ගුණාත්මය පවත්වාගෙන යාම සඳහා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිති සහතිකය වන්නේ,

(1) SLS ය. (2) IPNS ය. (3) ISO ය. (4) GAP ය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අවසාන වාර පරීක්ෂණය 2022

11 ශ්‍රේණිය **කෘෂි හා ආහාර තාක්ෂණය - II**

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) අනුරාධපුරය ප්‍රදේශයේ ජීවත්වන ගොවි මහතෙක් තමාගේ ගොවිපොළෙහි කෘෂි බෝග වගාවක්, සත්ත්ව පාලන ව්‍යාපෘතියක්, බලශක්ති නිෂ්පාදකයක් මෙන්ම මත්ස්‍ය වගාව සිදු කිරීමට අදහස් කරමින් සිටී.

(i) ඉහත ආකාරයට ගොවිපොලක් පවත්වාගෙන යෑම කුමන ගොවිතැන් ක්‍රමයක් ලෙසට හඳුන්වනු ලබයි ද? (ල. 02)

(ii) ඉහත වගාකිරීමේ ක්‍රමයේ ඇති වාසි දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(iii) එම ඉහත වගාක්‍රමයේ ඇති අහිතකර ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 02)

(iv) අනුරාධපුර ප්‍රදේශය අයත්වන දේශගුණික කලාපය නම් කරන්න. (ල. 02)

(v) ඉහත නම් කළ දේශගුණික කලාපයට අයත්වන ප්‍රධාන වර්ෂා ක්‍රමය සහ වර්ෂාව ලැබෙන කාලසීමාව කුමක් ද? (ල. 02)

(vi) ගොවිපොල තුළ කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමට එම ගොවි මහතා අදහස් කරගෙන සිටින්නේ නම් ඊට අදාළ අමුද්‍රව්‍ය 04 ක් සඳහන් කරන්න. (ල. 02)

(vii) කොම්පෝස්ට් නිෂ්පාදනයක් කළ යුතු ස්ථානයක තිබිය යුතු මූලික කරුණු 02 ක් ලියන්න. (ල. 02)

(viii) ගොවියා විසින්, ගොවිපොලෙහි බෝග සඳහා ශාකවල ඇති විවිධ කොළ වර්ග පොහොර ලෙස යෙදීමට අදහස් කරගෙන සිටින අතර ඒ සඳහා යොදාගත හැකි කොළපොහොර වර්ග 04 ක් ලියන්න. (ල. 02)

(ix) සත්ත්ව පාලනය උදෙසා ගොවියා විසින් එළ ගවයින් කිහිපයක් ඇති කිරීමට ද අදහස් කරගෙන සිටී. මේ සඳහා යොදාගත හැකි එළ ගව වර්ග 02 ක් ලියන්න. (ල. 02)

(x) ගව වර්ග ඇති කිරීමේ ප්‍රධාන ක්‍රම 03 කුමක් ද? (ල. 02)

(02) ශාක සතු ප්‍රජනනය කිරීමේ හැකියාව උපයෝගී කර ගනිමින් වගා කටයුතුවලට අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය නිපදවා ගැනීම ශාක ප්‍රචාරණය ලෙස හැඳින් වේ.

(i) (a) ශාක ප්‍රචාරණය කිරීමේ ප්‍රධාන ක්‍රම දෙක සඳහන් කරන්න. (ල. 02)

(b) ඉහත ප්‍රචාරණය ක්‍රම දෙකෙන් බීජ මගින් සිදුකරන ප්‍රචාරණය කුමක් නමින් හඳුන්වයි ද? (ල. 01)

(ii) (a) බීජ ප්‍රරෝහණය යනු කුමක් ද? (ල. 01)

(b) බීජ ප්‍රරෝහණයට අවශ්‍ය ප්‍රධාන සාධක 2 ක් ලියන්න. (ල. 02)

(c) සිටුවීම සඳහා යෝග්‍ය බීජවල තිබිය යුතු ලක්ෂණ 2 ක් සඳහන් කරන්න. (ල. 02)

(iii) බද්ධ කිරීමක් සඳහා යොදාගන්නා ප්‍රධාන උපකරණ දෙක මොනවා ද? (ල. 02)

(03) බෝග වගාවේ දී සිටුවන ලද බීජයක් හෝ පැලයක් මනාව පසේ සංස්ථාපනය වීමටත් ඉන්පසු හොඳින් වර්ධනය වීමටත් සුදුසු පාංශු පරිසරයක් ගොඩනැගීම බිම් සැකසීම ලෙස හැඳින්වේ.

(i) (a) බිම් සැකසීමේ ප්‍රධාන අරමුණු 04 ක් සඳහන් කරන්න. (ල. 02)

(b) බිම් සැකසීමේ ප්‍රධාන පියවර දෙක නම් කරන්න. (ල. 02)

(ii) (a) බෝග වගාවේ දී සකසනු ලබන ප්‍රධාන පාත්ති වර්ග 04 ලියන්න. (ල. 02)

(b) යම්කිසි ගොවියෙකු විසින් පොල් බෝගය වගාකිරීමට අදහස් කරගෙන සිටින්නේ නම් ඔහු විසින් තෝරාගත යුතු පාත්ති වර්ගය කුමක් ද? (ල. 01)

මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(iii) (a) ඔබ දන්නා ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණ 02 ක් සඳහන් කරන්න. (ල. 02)

(b) අතුරුයත්ගැම යන්න හඳුන්වන්න. (ල. 01)

(04) තවානක් යනු රෝපණ ද්‍රව්‍ය සිටුවා ප්‍රරෝහණයට හා පැල වර්ධනයට හිතකර පරිසරයක් ලබා දෙමින් ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු තත්වයට පත්වන තෙක් රැකබලා ගන්නා තාවකාලික ස්ථානයකි.

(i) (a) තවාන් අවශ්‍ය වන්නේ ඇයි ? (කරුණු 04 ක් ලියන්න.) (ල. 02)

(b) තවානක් සඳහා සුදුසු ස්ථානයක් තේරීමේ දී අප විසින් සැලකිලිමත් විය යුතු කරුණු 02 ක් සඳහන් කරන්න. (ල. 02)

(ii) (a) බඳුන් තවානක් සකසා ගනු ලබන්නේ කෙසේ ද? (ල. 01)

(b) මෙහි දී බඳුන් ලෙස යොදාගත හැකි ද්‍රව්‍ය 04 ක් ලියන්න. (ල. 02)

(c) තවාන් තැටි යොදාගත හැක්කේ කුමන ආකාරයේ බෝග වගා කිරීමේ දී ද? (ල. 01)

(iii) (a) තවානක් ජීවාණුහරණයක් යනු කුමක් ද? (ල. 01)

(b) තවානක් ජීවාණුහරණය කරන ක්‍රම 02 ක් ලියන්න. (ල. 01)

(05) ජලය සීමිත සම්පතක් වන බැවින් එය මතු පරපුර වෙනුවෙන් මනාව කළමණාකරණය කල යුතු අතරම බෝග වගාවේ දී ජලය භාවිතා කිරීම ඵලදායීව සිදු කිරීමකින් ඉහල කෘෂිකාර්මික අස්වැන්නක් කරා යා හැකිය.

(i) (a) බෝග වගාවට ජලයේ ඇති වැදගත්කම් 04 ක් ලියන්න. (ල. 02)

(b) බෝග වගාවේ දී ජල කළමණාකරණය කරන ප්‍රධාන උපාය මාර්ග 3 සඳහන් කරන්න. (ල. 02)

(ii) (a) පාංශු ජලය සංරක්ෂණය කළ හැකි ක්‍රම 02 ක් ලියන්න. (ල. 02)

(b) ඔබ දන්නා ස්වාභාවික වසුන් 02 ක් සඳහන් කරන්න. (ල. 02)

(iii) බෝගවලට ජලය සම්පාදනය කිරීමේ දී සලකා බලන ප්‍රධාන කරුණු 02 ක් ලියන්න. (ල. 02)

(06) බෝගවල ප්‍රශස්ත වර්ධනයට සහ අස්වැන්නෙහි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක බව දියුණු කිරීමට උචිත වන අයුරින් ස්වභාවික පරිසරය නවීකරණය කිරීම පාලිත තත්ව යටතේ බෝග වගාව ලෙස හඳුන්වයි.

(i) (a) පාලිත තත්ව යටතේ බෝග වගා කිරීමේ වැදගත්කම් 4 ක් ලියන්න. (ල. 02)

(b) පාලිත තත්ව යටතේ බෝග වගාකිරීමේ දී පරිසර තත්ව පාලනය කිරීමට යොදාගන්නා ව්‍යුහ කුමන නමකින් හැඳින්වේ ද? (ල. 01)

(ii) (a) ඔබ දන්නා තාවකාලික ආරක්ෂිත වගා ව්‍යුහ 02 ක් ලියන්න. (ල. 02)

(b) පාලිත තත්ව යටතේ බෝග වගාකිරීමට යොදාගන්නා ස්ථිර වගා ව්‍යුහ 04 ක් නම් කරන්න. (ල. 02)

(iii) (a) පොලිතින් ගෘහ භාවිතා කිරීමේ අවාසියක් ලියන්න. (ල. 01)

(b) නිර්පාංශු වගාවේ ඇති අවාසි 2 ක් සඳහන් කරන්න. (ල. 02)

(07) මානව පෝෂණයේ දී මිනිසාට අවශ්‍ය ප්‍රධාන පෝෂක සංඝටකයක් වන ප්‍රෝටීන ලබා ගැනීම සඳහා සත්ත්ව පාලනය ඉතා වැදගත් වේ.

(i) (a) ඝන ආස්තරණ ක්‍රමය හෙවත් ඩීප් ලීටර් ක්‍රමයට කුකුළන් ඇති කිරීමේ වාසි 04 ක් ලියන්න. (ල. 02)

(b) දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් මිළ දී ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු 04ක් ලියන්න. (ල. 02)

(c) ඝන ආස්තරණ ක්‍රමයේ දී අතුරුණුව ලෙස යොදා ගැනීමට සුදුසු ද්‍රව්‍ය 02 ක් ලියන්න. (ල. 01)

(ii) (a) ගව දෙනකගේ මද ලක්ෂණ හතරක් ලියන්න. (ල. 01)

(b) ගව දෙනෙකගේ ''වියළි කාලය'' යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? (ල. 01)

(iii) (a) ගවයන්ට වැළඳෙන කිරිඋණ රෝගයට හේතුව සඳහන් කර එහි රෝග ලක්ෂණයක් ලියන්න. (ල. 02)

(b) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් හඳුනාගෙන ඇති ගවපාලන කලාප 02 ක් නම් කරන්න. (ල. 01)

පිළිතුරු පත්‍රය - I කොටස

1 -(1)	2 -(1)	3 -(3)	4 -(1)	5 -(4)	6 -(2)	7 -(3)	8 -(3)	9 -(1)	10 -(2)
11-(3)	12 -(1)	13 -(4)	14 -(2)	15 -(2)	16 -(1)	17 -(4)	18 -(2)	19 -(1)	20 -(4)
21-(3)	22 -(3)	23 -(4)	24 -(3)	25 -(1)	26 -(2)	27 -(4)	28 -(2)	29 -(1)	30 -(2)
31-(1)	32 -(4)	33 -(1)	34 -(2)	35 -(1)	36 -(3)	37 -(2)	38 -(2)	39 -(2)	40 -(3)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් හිමි වේ.)

II කොටස

(01) (i) සමෝධානික ගොවිතැන් ක්‍රමය (ල. 02)

(ii) ★ සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගතහැකි වීම.
★ පසේ භෞතික, රසායනික, ජෛව ගුණාංග දියුණු කිරීම.
★ පොහොර සහ බලශක්තිය සඳහා යන පිරිවැය අඩුවීම.
★ වසර පුරා ආදායම් ලැබීම. (ඕනෑම කරුණු 02 කට ල. 02)

(iii) ★ කුඩා ඉඩම් සඳහා මෙම ක්‍රමය යොදා ගැනීම අපහසු වීම.
★ මූලික වියදම හා යෙදවුම් වැඩිවීම. (ල. 02)

(iv) වියළි කලාපය (ල. 02)

(v) ★ ඊසාන දිග මෝසම් වර්ෂාව (ල. 01)
★ නොවැම්බර් සිට පෙබරවාරි (ල. 01)

(vi) ★ රනිල ශාක පත්‍ර
★ සුලබ සත්ත්ව අපද්‍රව්‍ය (ගොම, කුකුල් පොහොර)
★ රොක් පොස්පේට්
★ ජලය
★ කළු පොලිතීන් (ල. 02)

(vii) ★ නිවාස සහ ලිංවලින් ඈත් වූ ස්ථානයක් වීම.
★ ප්‍රවාහන පහසුකම් සහිත වීම.
★ අමුද්‍රව්‍ය පහසුවෙන් සපයාගත හැකි වීම.
★ ජල පහසුකම් සහිත ස්ථානයක් වීම. (ල. 02)

(viii) ★ ග්ලිරිසිඩියා ★ සැල්වීනියා ★ ජපන් ජබර ★ කැකුණ
★ එරබදු (ල. 02)

(ix) ★ සහිවාල් ★ රතු සින්දි ★ දේශීය ගව වර්ග (ල. 02)

(x) නිදැලි ක්‍රමය, අඩ සියුම් ක්‍රමය, සියුම් ක්‍රමය (ල. 02)

(02) (i) (a) ලිංගික ප්‍රචාරණය අලිංගික ප්‍රචාරණය (ල. 02)
(b) ලිංගික ප්‍රචාරණය (ල. 01)

(ii) (a) බීජයක් තුළ ඇති කලලය නව ශාකයක් බවට පත්වීමේ ආරම්භය බීජ ප්‍රරෝහණයයි. (ල. 01)
(b) ★ බීජයේ ජීව්‍යතාවය ★ තෙතමනය ★ ඔක්සිජන් ★ ප්‍රශස්ත උෂ්ණත්වය
★ ආලෝකය (ල. 02)
(c) ★ ප්‍රවේණික පාරිශුද්ධතාව. ★ භෞතික පාරිශුද්ධතාව.
★ බොල් බීජවලින් තොරවීම. ★ වල් පැලෑටිවලින් තොරවීම. (ල. 02)

(iii) ★ බද්ධ පිහිය ★ සෙකටියරය (ල. 02)

(03) (i) (a) ★ පසේ භෞතික තත්වය දියුණු කිරීම.
★ බෝගයේ මූල පද්ධතිය පැතිරීමට පහසුවන පරිදි පස බුරුල් කිරීම.
★ පසේ ගල්මුල් ඉවත් කිරීම.
★ පසට පොහොර මිශ්‍ර කිරීම.
★ පලිබෝධ පාලනය කිරිම. (ල. 02)
(b) මූලික බිම් සැකසීම. ★ අතුරුයත් ගෑම (ල. 02)

(ii) (a) ★ උස් වූ පාත්ති ★ ගිල් වූ පාත්ති ★ වැටි සහ කානු ★ තනි වගා වලවල් (ල. 02)
(b) තනි වගා වලවල් (ල. 01)

(iii) (a) ★ උදැල්ල ★ උදලු මුල්ලුව ★ නගුල් වර්ග ★ පා මුල්ලුව (ල. 02)
(b) බෝගයක් ක්ෂේත්‍රයේ සංස්ථාපනය කිරීමෙන් පසු පස සම්බන්ධව සිදුකරන ක්‍රියාකාරකම් (ල. 01)

(04) (i) (a) ★ තවානෙහි දී පැලවලට ගැලපෙන ලෙස පරිසර තත්ව පාලනය කළ හැකිය.
★ ශක්තිමත් නිරෝගී පැල වැඩි සංඛ්‍යාවක් නිපදවා ගත හැකි.
★ ඍජුවම ක්ෂේත්‍රයේ සිටුවීම අපහසු කුඩා බීජවලින් පැල නිපදවාගත හැකිය.
★ තවානකදී කුඩා පැල පහසුවෙන් රැකබලා ගත හැකිය.
★ නිරෝගී පැල පමණක් තෝරා ක්ෂේත්‍රයේ සිටුවිය හැකි වීම. (ල. 02)

(b) ★ නිතරම අවධානය යොමු කළ හැකි ස්ථානයක් වීම.
★ හිරු එළිය හොඳින් ලැබෙන ස්ථානයක් වීම.
★ ජලය ලබාගැනීමේ පහසුකම් සහිත ස්ථානයක් වීම.
★ සමතලා බිමක් වීම.
★ අධික සුලං නොමැති ස්ථානයක් වීම. (ල. 02)

(ii) (a) තවාන් මිශ්‍රණය තරමක් තෙත්කර බඳුන්වලට පිරවීමෙන් බඳුන් තවානක් සකසාගනු ලබයි. (ල. 01)

(b) ★ ප්ලාස්ටික් කෝප්ප ★ පොල් ලෙලි ★ කිරිහට්ටි ★ ප්ලාස්ටික් බඳුන්
★ පොල් කටු ★ පොලිතින් බඳුන් (ල. 02)

(c) ★ මිල අධික දෙමුහුම් බෝග ප්‍රභේද ★ ගෝවා ★ බටු
★ තක්කාලි (ල. 02)

(iii) (a) සකස් කරගත් තවානක් හෝ තවාන් මාධ්‍යයේ සිටින ව්‍යාධිජනකයින් රෝගාකාරක බැක්ටීරියා සහ කෘමි හා වෙනත් පලිබෝධ කොටස් විනාශ කිරීම තවාන් ජීවාණුහරණයයි. (ල. 01)

(b) සූර්ය තාපය මගින් / පිලිස්සීම මගින් / උණු ජලය මගින් / රසායනික ද්‍රව්‍ය මගින් (ල. 01)

(05) (i) (a) ★ ප්‍රභාසංස්ලේෂණය ඇතුලු කායික ක්‍රියාවලි සඳහා. ★ බීජ ප්‍රරෝහණය සඳහා.
★ බීජ පැල සිටුවීම සඳහා. ★ සමහර බීජවල ව්‍යාප්තිය සඳහා
★ ශාක පොෂණ අවශෝෂණය සඳහා
★ බිම් සැකසීමේ පහසුව සඳහා (ල. 02)

(b) ★ පාංශු ජල සංරක්ෂණය ★ ජල සම්පාදනය ★ ජල වහනය (ල. 02)

(ii) (a) ★ පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම. ★ පසට වසුන් යෙදීම.
★ වල් පැලෑටි ඉවත් කිරීම.
★ පලතුරු සහ විසිතුරු ශාකවල අනවශ්‍ය අතු කැපීම. (ල. 02)

(b) ★ පොල් අතු ★ පිදුරු ★ වියලි වල් පැලෑටි ★ කොහුබත් (ල. 02)

(iii) ★ වගාකර ඇති බෝගය ★ බෝගයේ වර්ධන අවස්ථාව
★ ජලය සැපයීමේ අරමුණ ★ පසේ වයනය (ල. 02)

(06) (i) (a) ★ බෝගයට අවශ්‍ය පරිසර සාධක ප්‍රශස්තව ලබා දෙන බැවින් වැඩි අස්වැන්නක් ලබා ගත හැකිවීම.
★ පරිසර සාධක ප්‍රශස්ත වීමට අමතරව පලිබෝධ හානි අවම වන බැවින් අස්වනුවල ගුණාත්මකබව වැඩි වීම.
★ පාලිත තත්ව යටතේ වගාකිරීමෙන් අවාරයේ අස්වනු ගත හැකි වීම.
★ පටක රෝපණයක් ලබා ගන්නා පැල බාහිර පරිසරයට අනුවර්තනය කර ගැනීම සිදු කර ගත හැකි වීම.
★ අහිතකර කාලගුණික සාධක පාලනය කරගත හැකිවීම. (ල. 02)

(b) ආරක්ෂිත වගා ව්‍යුහ. (ල. 01)

(ii) (a) තනි පැල ආවරණ / පේළි ආවරණ / පාත්ති ආවරණ / සූර්ය ප්‍රචාරක (ල. 02)

(b) පොලිතින් ගෘහ / දැල් ගෘහ / ලී පටි ගෘහ / වීදුරු ගෘහ / හරිතාගාර (ල. 02)

(iii) (a) ★ සැකසීමට අධික වියදමක් දැරීමට සිදුවීම.
★ තාක්ෂණික දැනුම තිබිය යුතු වීම.
★ සුළඟ නිසා පොලිතින් ඉරිය හැකිය. (ල. 01)

(b) ★ මූලික වියදම අධිකය ★ ඉහල තාක්ෂණික දැනුමක් අවශ්‍යය. (ල. 01)

(07) (i) (a) ★ ඒකීය ඉඩ ප්‍රමාණයක වැඩි සතුන් ගණනක් ඇති කිරීමට හැකි වීම.
★ බෝගවලට හානි සිදු නොවේ. ★ විලෝපීයයන්ගේ සිදුවන හානි අඩු වීම.
★ බිත්තර පිරිසිදුව සහ සුරක්ෂිතව ලබා ගත හැකි වීම.
★ පාලනය පහසු වීම. ★ පරපෝෂිත රෝග බෝවීම අඩුය.
★ බිත්තර එකතු කිරීම පහසුය. (ල. 02)

(b) ★ නිරෝගි පැටවුන් විය යුතුය. ★ පැටවුන් ඒකාකාර විය යුතුය.
★ කඩිසර, දීප්තිමත් ඇස් සහිත පැහැපත් පෙනුමක් ඇති සතුන් විය යුතුය.
★ විකෘති වලින් තොර පැටවුන් විය යුතුය. (ල. 02)

(c) ★ දහයියා ★ රටකජු ★ පිදුරු කැබලි ★ යතු කුඩු (ල. 01)

(ii) (a) ★ ආහාර ගැනීම අඩුකිරීම. ★ නිතර නිතර කෑ ගැසීම.
★ යෝනිය ඉදිමී රතු පැහැවීම. ★ නොසන්සුන් බව.
★ පැහැදිලි අවර්ණ උකු ශ්‍රාවයක් යෝනියෙන් පිටවීම. (ල. 01)

(b) පැටවා ගැබීමට මාස දෙකකට පෙර කාලය වියලි කාලය නම් වේ. (ල. 01)

(iii) (a) ★ කැල්සියම් ඌනතාවය
ලක්ෂණ - ★ හිසේ වෙව්ලක ස්වභාවය ★ පූර්ව පාද දුරදඬුවීම නිසා බිම ඇද වැටීම.
★ සිහිමද ගතිය ★ ශරීර උෂ්ණත්වය පහල යාම (ල. 02)

(b) ★ පොල් ත්‍රිකෝණය ★ මැදරට කාලපය ★ යාපනය අර්ධද්වීපය
★ පහතරට තෙත් කලාප ★ උඩරට කලාපය ★ පහතරට වියලි කලාපය (ල. 01)